

# සිනහව අතරින් කඳුලක් උපන්නා

චිත්‍රපටියේ නාමාවලියේ සුනිල් ටී නිශ්පාදනයක්, සනත් ගුණතිලක අධ්‍යක්ෂණයක් සදහන් වුනා. පැය 1 1/2 ක් චිත්‍රපටය බැලුවා. ටිකින් ටික හොද නරක අඩු වැඩි වශයෙන් හිත ඇතුලේ එකතු වුනා. කාලෙකට පස්සේ සේමිණි ඔයා හොදටම රගපාලා තිබුනා. සමහර තැන් ඇත්තටම හරිම අපූරුයි සේමිණි, නිරෝෂා පලවෙනි වතාවට චිත්‍රපටයක සංගීතය අධ්‍යක්ෂණය කරලා. අපූරු වෙනසක් තිබුනා, තැන් කිහිපයක හැර ඒ සංගීතය හරිම ලස්සනයි. නිරෝෂා ඔයා ආයෙමත් අපිට හැගෙව්වා ඔයා තමයි සිංහල සිනමාවේ හොදම හඬ කියලා මෑත කාලයේ. සතුටුයි..... චිත්‍රපටයේ තිරපිටපත ඉතා ඉහලයි කියලා මට දැනුනා. සනත් අයියේ ඔයා හොද අධ්‍යනයක් කරලා ලියපු පිටපතක්, දෙබස් එහෙම හරිම අපූරුයි.

චිත්‍රපටය බලනකොට මේ තැන හොදට හිතේ තියාගෙන බලන්න. 'විමල්ගෙන් කුමාරිට සර්ප්‍රයිස් බර්ත්ඩේ පාටියක්, කුමාරි අමන්දානන්දයට පත්වෙනවා. ඒ මොහොතේ කුමාරිට හිතෙනවා විමල්ටත් තෑග්ගක් දෙන්න ඕනේ කියලා. ඒ නිසා ඇය කියනවා මට දරුවෙක් ලැබෙන්න ඉන්නවා කියලා. දැන් අපි මොකද කරන්නේ කියලා විමල් අහනවා' මේ තමයි ටර්නින් පොයින්ට් එක. මේ චිත්‍රපටිය මාරයි. කාලෙකට පස්සේ සිංහල සිනමාවට අපූරු චිත්‍රපටයක් අරන් ඇවිල්ල තිබුනා සනත් අයියා හොද පිටපතක් එක්ක. අවසාන මිනිත්තු 10 අපිව හොදටම රිදෙව්වා. හෘද ස්පන්දනය වැඩිවන එක වලක්වන්න බැරි වුනා. පපුව ගැහිලා ඇඩෙන්න ආව, ඒක තමයි මේ චිත්‍රපටියේ තිබුණු අපූරුව.

හා........ මට අමතක වුනා... හෂිනි ගෝනගල එයාගේ කොටස ඉතා හොඳින් කරලා තිබුනා. සනත් අයියාට තව හොදට රඟපාන්න පුළුවන් බව මම දන්නවා, සුනිල් ටී ප්‍රනාන්දුට චිත්‍රපටය ඉවර වෙලා මම කිවුවා මේක තමයි ඔයා නිෂ්පාදනය කරපු හොදම චිත්‍රපටය කියලා. එතකොට එයා ඇහුවා අනිත් ඒවා හොද නැද්ද කියලා, මම අයෙමත් කිවුවා මේක හොදම එක කියලා. විටින් විට වූ අඩුපාඩු මැද 'සිනහව අතරින් ' කාලෙකට පස්සේ දැක්ක හොද commercial film එකක් කියලා මට දැනුත් හිතෙනවා. ආයේ ආයෙමත් හිතෙනවා. අවසානයේ දුව තමාගේ තාත්තට (හාමුදුරුවන්ට) අම්මාට දුන්න මුද්ද පෙන්වන තැනින් නතර වුනා නම් අපිට අඩ අඩාම එලියට එන්න තිබුනා. සනත් අයියේ film එක හරිම ලස්සනයි.

**සිනහව අතරින් කඳුලක් උපන්නා.....** — **මම, කැලුම් පාලිත මහීරත්න**









## ආශාට සිනමාව හීනයක් ද?

ආශා එදිරිසිංහ ජනප්‍රිය ටෙලි නිළියක් වගේම නිවේදිකාවක්. ඇය ජනප්‍රිය නිළි සම්මානය පවා දිනාගත් නිළියක්. රූපවාහිනියෙන් දකින ආශා සිනමාවෙන් දකින්න නැත්තේ ඇයි කියලා අපි ඇහැව්වා.

ආරාධනා නම් ලැබුනා, ඒත් ඒ ලැබුන චරිත මට ගැලපෙන්නේ නැහැ කියලා හිතුනා. ඒවා ප්‍රතික්ෂේප කළා. කැමති වුන නිර්මාණවල රූගත කිරීම්වලට පිටරට යන්න තිබුනා. ඒවට තාත්තා එක්ක යන්න ඕන කිව්වම එයාලා එකඟ වුනේ නැති නිසා මම ඒවා ප්‍රතික්ෂේප කළා.'

ඒ කියන්නේ ආශාට සිනමාව හීනයක්ද?
'හීනයක් වෙයිද දන්නේ නැහැ, ඒත් කවදාහරි අපට චිත්‍රපටයක් කරන්න පුළුවන් වෙයි කියන විශ්වාසය තියෙනවා. බලමු නේද?'




ගීතිකා රාජපක්ෂ යොවුන් නිළියක්. ඇයව දන්නා අය මෙන්ම නොදන්නා ප්‍රේක්ෂකයන්ද සිටියි. පසුගිය සති අන්ත පුවත්පත් අතිරේකයකට ඈ පවසා තිබුනේ 'පුංචි පුංචි චරිත රඟපාන්න කැමති නැහැ. ප්‍රධාන චරිත සඳහා පමණයි පෙනී සිටින්නේ.' කියලා. ඒ ඇගේ කැමැත්ත වුනත්, ඇයට අපේ ප්‍රවීණ නළු නිළියන් ආදර්ශයට ගන්නට තිබුනානම් යැයි සිතෙන්නේ, මෙවන් ආකල්ප මතින් ක්ෂේත්‍රයේ පවතින්නට නොහැකි නිසාවෙනි.

ගීතිකා තවමත් රංගනය තුළ අංකුරය. එවැන්නියකට ප්‍රධාන චරිත මගින් රැදෙන්නටද නොහැකිය. යමක් කළ හැකි චරිත ස්පර්ශ කළ පසු ප්‍රධාන නිළියක් වන්නට ඇයට සුදුසුකම් ඇතිවන තුරු රංගන විෂය ගැන දැනුමක් නැති ඇය වැන්නියන් පළමුව සිතිය යුත්තේ චරිතයේ ප්‍රභේදය නොව ස්වභාවයයි.